# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2005 අංක 35 දරන ශ්‍රී ලංකා හෙද සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කලේ **2005** ඔක්තෝබර් මස **3** වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2005 ඔක්තෝබර් මස 07 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල **:** රු. 4.25 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

# 2005 අංක 35 දරන ශ්‍රී ලංකා හෙද සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2005 ඔක්තෝබර් මස 3 වැනි දින]

එල්. ඩී.–ඕ. 8/2003.

## 1988 අංක 19 දරන ශ්‍රී ලංකා හෙද සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2005 අංක 35 දරන ශ්‍රී ලංකා හෙද සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. (ලුහුඬු නාමය.)

2. 1988 අංක 19 දරන ශ්‍රී ලංකා හෙද සභා පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— (1988 අංක 19 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.)

(1) එම වගන්තියේ (ii) වන ඡේදයේ "සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ ශික්ෂණ රෝහල් අමාත්‍යාංශයේ" යන වචන වෙනුවට "සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ පළාත් රාජ්‍ය සේවයේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (iii) වන ඡේදයේ "සෞඛ්‍ය අමාත්‍යාංශයේ " යන වචන වෙනුවට "සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ පළාත් රාජ්‍ය සේවයේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ (iv) වන ඡේදයේ "සෞඛ්‍ය අමාත්‍යාංශයේ" යන වචන වෙනුවට "සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ පළාත් රාජ්‍ය සේවයේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) එම වගන්තියේ (v) වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(v) පළාත් රාජ්‍ය සේවයේ හෙද නිලධාරින් විසින් තෝරාපත් කර ගන්නා ලද –

(අ) පළාත් රාජ්‍ය සේවයේ නියුක්තව සිටින්නා වූ ද ;

(ආ) අවුරුදු දොළහකට නොඅඩු කාලයක් හෙද වෘත්තියෙහි පළපුරුද්ද ඇත්තා වූ ද ; සහ

(ඇ) නියමිත පශ්චාත් උපාධි සුදුසුකමක් ලබා ඇත්තා වූ ද,

ලියාපදිංචි වෘත්තීය හෙදවරයන් ;" ;

(5) එම වගන්තියේ (vii) වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(vii) අවම වශයෙන් අවුරුදු පහක් හෙද වෘත්තියෙහි යෙදීමේ පළපුරුද්ද ඇති සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සහ පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික හෙදියන් අතරින් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සහ පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික හෙද නිලධරයන් විසින් තෝරාපත් කර ගනු ලබන ලියාපදිංචි වෘත්තීමය හෙදියන් පස් දෙනෙක් ";

(6) එම වගන්තියේ (x) වන ඡේදය ඉවත් කිරීමෙන් ;

(7) එම වගන්තියේ (xv) වන ඡේදය ඉවත් කිරීමෙන් ; සහ

(8) එම වගන්තියේ (xvi) වන ඡේදයෙහි "ආයුර්වේද දෙපාර්තමේන්තුවේ" යන වචන වෙනුවට "ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සහ පළාත් සභාවල ආයුර්වේද ආරෝග්‍ය ශාලාවල සේවය කරන පළාත් රාජ්‍ය සේවයට අයත් හෙද නිලධරයන් ;".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.